**නින්තවූර් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දින සභාපතිවරයාට වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට නින්තවූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට Motor Grader යන්ත්‍රය වෙනුවෙන් ලැබිය යුතු කුලී රු. 182,720 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. | හිඟ මුදල් මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වේ. | 2015 වර්ෂයට පෙර මෙවැනි ශේෂයන් තිබුණද, දැනට හිඟ මුදලින් රු. 89,740 ක් අයකර ගෙන ඇත. ඉතිරි මුදලද අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | සභාවේ පැරණි කාර්යාල ගොඩනැගිල්ල කුලියට දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා හිඟව තිබූ කුලිය රු.540,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ මුදල මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වේ. | සභාවේ පැරණි කාර්යාල ගොඩනැගිල්ල 2015 සැප්තැම්බර් 22 දින සිට 2018 සැප්තැම්බර් 12 දක්වා සෞඛ්‍ය රාජ්‍ය ඇමැතිතුමාගේ ප්‍රාදේශීය කාර්යාලය සඳහා බදු දිම වෙනුවෙන් අයවියයුතු මාසික හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර ඇත. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයන් 04 ක ආදායම් වියදම් ගිණුම් සහ හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අතර රු.657,261 ක් නොසැසඳීම් විය. | අදාල නොසැසඳීම ගැලපීම් කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මුදල් වර්ෂය සඳහා පිළියෙල කරන ලද අවසන් ගිණුම් ප්‍රකාශයේ ප්‍රා.සා. 17, ප්‍රා.සා 19 ප්‍රකාශයේ නිවැරදිව සටහන් කළ ශේෂයන් ප්‍රා.ස. 07 වාර්තාව වැරදීමකින් සටහන් කර තිබුණි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති විම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.42,842,560 ක් වටිනා ස්ථාවර වත්කම් ගිණුම් විෂයන් 05 කට අදාල ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය, අයිතිය පිළිබඳ පොත්, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා පුස්තකාල පොත් ලේඛනය ආදී තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබු ගිණුම් ශේෂ සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අපගේ සභාවේ වත්කම් ලේඛනය පවත්වාගෙන ගියද, ඉඩම් ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නිවැරදිව සටහන් කර නොතිබුණි. දැනට නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්මවූ රු.1,442,553 ක් වටිනා කල් ඉකුත්වූ තැන්පත් 26 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාල රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | වර්ෂ දෙකක් ඉකුත්වූ කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර ගැලපීම් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 27,100,729 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදයම් ඉක්මවූ වියදම් රු. 4,043,938 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,848,000 | 5,385,700 | 5,815,785 | 4,387,593 | 8,848,000 | 4,464,300 | 2,984,750 | 4,817,677 |
| කුලී | 6,232,000 | 5,816,471 | 5,880,371 | 3,186,666 | 8,415,000 | 5,134,940 | 5,159,570 | 3,250,566 |
| බලපත්‍ර ගාස්තු | 985,000 | 1,100,780 | 1,100,780 | - | 1,025,000 | 827,150 | 827,150 | - |
| වෙනත් ආදායම් | 17,490,000 | 31,564,097 | 14,569,056 | 20,339,832 | 13,025,000 | 12,784,869 | 12,618,037 | 3,344,790 |
| | **34,555,000** | **43,867,048** | **27,365,992** | **27,914,091** | **31,313,000** | **23,211,259** | **21,589,507** | **11,413,033** |

#### 2.2.2 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1980 සිට 2012 වර්ෂය අවසානය දක්වා හිඟව තිබූ මස්කඩ බදු කුලි රු.3,173,466 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන තොනිබුණි. | ඉකුත් වර්ෂයේ හිඟ මුදල් සමඟ සමාලෝචිත වර්ෂයේ ආදායම්ද අයකිරීමට කටයුතු කළ යුතු වේ. | දීර්ඝ කාලයක සිට අයනොවී පවතින හිඟ මස්කඩ කුලි නිසිපරිදි කපා හැරීමට 04 වනි සභාවේ 28 වන රැස්වීමේදී තීරණය කරන ලදුව, ඒ අනුව අනුමැතිය ලැබුණු පසු ලියවිලි ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධන

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් විධිමත් කිරීම ඇතුළු ප්‍රධාන කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතු වුවද, 2019 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රධාන කාරණා 14 ක් සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර නොතිබුණි. | ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | අප සභාව විසින් සමහර කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කරන අතර ඔබ විසින් පෙන්වා දුන් පරිදි අනෙකුත් කාරණා සඳහාද අතුරු ව්‍යවස්ථා පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සකස්කර තිබූ අතුරු ව්‍යවස්ථා 06 ක් අනුව සභාව විසින් ඉටු කළයුතු වැදගත් කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වේ. | අප සභාවේ වර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මහජන සහභාගිත්වයෙන් ඔවුන්ගේ ඕනෑඑපාකම් අනුව ප්‍රමුකත්වයක් දි 2019- 2022 වර්ෂ කාල පරිච්ඡේදය සඳහා සැලැස්ම පිළියෙල කර ඇත. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ කසල වෙන්කර භාර ගැනීම වෙනුවෙන් පවුල් 5,000 ක් සඳහා බෑග් 10,000 ක් රු.385,000 ක මුදලකට මිලදී ගෙන තිබූ නමුත් ඉන් බෑග් 2,363 ක් නිකුත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ එකතු කරන ලද කසල ටොන් 720 ක් වර්ගීකරණය සහ ප්‍රතිචක්‍රියකරණය නොකර බැහැර කර තිබුණි. | ඝන අපද්‍රව්‍ය වර්ගී කරනය කර භාර ගැනීමටද, ප්‍රතිචක්‍රිය කරනයට යොදවා ගත යුතු වේ. | ඉතිරි බෑග් 2,363 ක් දැනටමත් මහජනයාට නිකුත් කරමින් පවති. මෙය කඩිනම් කිරීම සඳහා කටයුතු කර ඇත. මෙම ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීය කිරීමේ පහසුකම් අප සභාවේ නොමැති බැවින් අඩ්ඩාලචේනයි ඝණ අපද්‍රව්‍ය එකතුකරන මධ්‍යස්ථානයට යවනු ලැබේ. |

(ඈ) තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයම ක්‍රියා කළ යුතු වුවත්, මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ලඟා කරගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අදාල ඉලක්ක හඳුනාගෙන ඒවා ලඟා කරගැනීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. | වර්ෂයේ තිරසාර සංවර්ධන වැඩ සටහනේ ඉලක්ක 17 ක් වැළඳ ගැනීම සඳහා අප සභාව විසින් ව්‍යාපෘති ආරම්භ කර තිබුණද, එය නිසි ලෙස පිළියෙල කර නොතිබුණි. ඉදිරියේදී එම වැඩසටහනේ ඉලක්කවලට අනුව ව්‍යාපෘති සකස්කර ඉලක්ක කරා ලඟාවීමට අවශ්‍ය කටයුතු කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වීථි පහන් විදුලි පාරිභෝජනය වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවිය යුතු විදුලි ගාස්තු රු.2,951,150 ක් සහ විදුලි බල මණ්ඩලයෙන් සභාවට ලැබියයුතු රු.2,477,322 ක මුදල් ගෙවීමට සහ අයකර ගැනීමට කටයුතු නොකර වර්ෂ 22 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණි. | අදාල හිඟ මුදල කපා හැරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අදාල පරිදි කපා හැරීමට කටයුතු කිරීම සඳහා අපගේ 04 වෙනි සභාවේ 28 වෙනි රැස්වීමේදි තීරණය කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලද විගස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙමි. |
| (ආ) | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන මෝටර් වාහන සහ යන්ත්‍ර 05 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට අනුමත තනතුරුවල පුරප්පාඩු 10 ක් විය. | අත්‍යවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු පිරවීම සඳහා අප විසින් දිගටම අවශ්‍ය කටයුතු කරමින් පවතින අතර, අප සභාවේ කොන්ත්‍රාත් පදනමින් දින 180 ක් අඛණ්ඩ සේවයක් කර ඇති සේවකයන්ගෙන් පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ස්ථාන මාරුවී ගිය සහ සේවය හැර ගිය සේවකයින් 24 දෙනෙකුගෙන් අයවිය යුතු රු.104,957 ක් වූ ණය ශේෂය 2013 වර්ෂයේ සිට අයකර ගැනීමකින් තොරව පැවතුනි. | හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ණය මුදල අදාල නිලධාරීන්ගෙන් සහ ඔබුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

---------------------------

**3.4.1 වත්කම් ලේඛන ගත නොකිරීම**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------------------- |
| සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු ඉඩම් සහ ගොඩනැගිලිවල එකතු වටිනාකම රු.186,982,607 ක් ලෙස ගිණුම්වල පෙන්වා තිබුණද, චංචල හා නිශ්චල වත්කම් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | සංචල හා නිශ්චල වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. | ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කර ඇති අතර, දැනට විෂයභාර නිලධාරියා විසින් එම රාජකාරිය කරන අතර, සම්පූර්ණ වාර්තාවක් ඔබ වෙත ඉදිරිපත් කරමි. |

**3.4.2 නිෂ්ක්‍රීය වත්කම්**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ----------------------------- |
| අවුරුදු 05 කට පෙර ඉදිකළ නින්තවුර් පොදු වෙළඳ පොළෙහි කඩ කාමර 13 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | සභාවේ කඩ කාමරවලින් ආදායම් ඉපයීමට කටයුතු කළ යුතු වේ. | පොදු වෙළඳ පොළෙහි කඩකාමර බදු දීමට දැනට කටයුතු කරමින් පවතී. |

**3.5 ප්‍රසම්පාදන**

------------

**කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------------------- |
| 2019 වර්ෂයේ PIDPs ව්‍යාපෘතිය යටතේ මාර්ග 10 ක සහ සුසාන භූමි සඳහා එකතුව රු.8,329,900 ක් වියදමින් LED විදුලි බුබුළු 400 ක් සවිකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | |
|---|---|---|
| (i) 600,000 W LED විදුලි බුබුළු 400 ක් සහා බලප්‍රදේශයේ සවිකිරීම සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වේ. | උක්ත විදුලි බුබුළු සහා බල ප්‍රදේශයේ සවිකිරීම් සඳහා ගරු සභාපතිතුමා විසින් ලංකා විදුලි බල මණ්ඩල සමඟ සාකච්ඡාකලත් එය ලිඛිතව ලබා ගෙන නොමැත. |
| (ii) රජයේ ප්‍රසම්පාදන අත්පොත (supplementary 34) 2.14.1 අනුව මෙම කොන්ත්‍රාත්තුව සහ අවම වශයෙන් සීල් තබන ලද මිලගණන් 05 ක් ලබා ගත යුතු වුවත්, එයට පටහැනිව කොටස් දහයකට බෙදා ප්‍රජා පාදක සමිති 10 කට සෘජුව බාර දී තිබුණි. | රජයේ ප්‍රසම්පාදන අත්පොත අනුව මිලගණන් කැඳවා සුදුසු මිල සහ තත්වය අනුව භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළ යුතු වේ. | උක්ත කොන්ත්‍රාත්තුව වෙළඳ හා වාණිජ අමාත්‍යාංශයෙන් කොටස් 10 කට වෙන් කර මූල්‍ය ප්‍රතිපාදන අප වෙත එවා තිබුණි. විදුලි භාණ්ඩවල මිල වෙළඳ පොළ මිල ගණන අනුව සසඳා ඇස්තමේන්තු සකස්කර දිස්ත්‍රික් පළාත් මට්ටමේ කාර්මික නිලධාරීන් සහ ඉන්ජිනේරුවරු විසින් පරීක්ෂාකර බලා ප්‍රජා පාදක සමිතිවලට භාර දී ඇත. |
| (iii) මෙහිදී එකක් රු.15,400 ක් බැගින් විදුලි බුබුළු 328 ක් සහ එකක් රු.15,850 ක් බැගින් විදුලි බුබුළු 72 ක් සවිකර තිබුණි. මෙම වර්ගයේම විදුලි බුබුළු කරෙයිතිවු ප්‍රාදේශීය සභාව විසින් රු.9,600 ක් බැගින් ලබා ගෙන සවිකර තිබුණි. මේ අනුව සභාව විසින් රු.2,352,400 ක අරපිරිමැසුම් රහිත ගෙවීමක් සිදු කර තිබුණි. | මිලදී ගැනීම් කිරීමේ දී අනෙකුත් ආයතන සමඟ ද සැසඳා බලා අරපිරිමැසුම් සහිතව කළ යුතු වේ. | අපගේ තාක්ෂණ සේවා නිලධාරි විසින් දිස්ත්‍රික්කයේ තිබෙන කඩවලින් භාණ්ඩ වල මිල ගණන් විමසා මෙම ඇස්තමේන්තුව සකස්කරන ලදි. වයර් සහ විදුලි බුබුළු සවිකිරීමේ ගාස්තු ද මෙයට ඇතුළත් වී ඇත. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

---------------------------------------

**4.1 අභ්‍යන්තර විගණන**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාවේ අභ්‍යන්තර විගණනයන් සිදුවී නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වේ. | ඔබ විසින් පෙන්වා දුන් පරිදි අභ්‍යන්තර විගණන කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා රැස්වීම් පවත්වීමට කටයුතු කළ යුතු වේ. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා රැස්වීම් පවත්වා එහි වාර්තා ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 4.3 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාවේ JCB රථය බාහිර පුද්ගලයන්ට කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු රු.530,820 ක හිඟ කුලී අයකර ගැනීමට හෝ අදාල අයට එරෙහිව නිත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | අයවියයුතු කුලී අයකිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | JCB රථය පිටතට බදු දීමෙන් ලැබිය යුතු මුදලින් රු. 47,100 ක් අයකර ඇත. ඉතිරි මුදලද අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |